සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ (ශ්‍රී.ලං.මි.සේ.) II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(2018)

## (01) ඉඩම් නීතිය සහ ඉඩම් මැනීම

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. (i) (අ) දිස්ත්‍රික් උසාවිය මගින් සර්වේයර් ජනරාල් වෙත උසාවි කොමිසමක් නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ කවර වගන්තියක් ප්‍රකාරව ද?

(ආ) උසාවි මැනුමක මායිම් සලකුණු කරනු ලබන්නේ කෙසේ ද?

(ඉ) එසේ සලකුණු කරන ලද මායිම් පෙන්වා දෙනු ලබන්නේ කා හට ද? (ලකුණු 06 යි)

(ii) උසාවි කොමිසමක පිඹුරු සකස් කරන ආකාරය, අධිස්ථාපනය කිරීම, කැබලි අංක කිරීම හා බිම් කැබලි උපලේඛනය සකස් කරන ආකාරය විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

(iii) (අ) ඉඩම් අත්පත් කර ගැනීමේ ඉල්ලීම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත යවනු ලබන්නේ කවර විධිවිධාන යටතේ ද?

(ආ) කිසියම් බිම් කොටසක් සඳහා හිමිකම් කියන්නන් එක් අයෙකුට වඩා ඉදිරිපත් වුවහොත් මිනින්දෝරුවරයා විසින් ගන්නා ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 06 යි)

2. (i) (අ) ශ්‍රී ලංකාවේ මැනුම් පනත අනුව සර්වේයර් ජනරාල්වරයාගේ කර්තව්‍යයන් මොනවා ද?

(ආ) සර්වේයර් ජනරාල් සතු බලතල මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට පැවරීම සඳහා අදාළ කරගත යුත්තේ මැනුම් පනතේ කුමන වගන්තිය ද? (ලකුණු 08 යි)

(ii) (අ) හිමිකම් ලියාපදිංචි කිරීමේ ප්‍රධාන පියවර සඳහන් කර, එම එක් එක් පියවර සඳහා වගකිවයුතු ආයතන සඳහන් කරන්න.

(ආ) සර්වේයර් ජනරාල්වරයා විසින් කඩඉම් සිතියම් සකස් කරනු ලබන්නේ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ කවර වගන්තියක් යටතේ ද? (ලකුණු 06 යි)

(iii) කැඩැස්තර මැනුම් සිදුකරනු ලබන ප්‍රදේශයක බිම් කැබලිවල විමර්ශනය කිරීම හා මායිම් ගල් යෙදීමේ දී මිනින්දෝරුවරයාගේ කාර්යයභාරය කුමක් ද? (ලකුණු 06 යි)

3. (i) (අ) මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් හා සිතියම්ගත කිරීමේ දී වර්තමානයෙහි භාවිත කරනු ලබන නවීන තාක්ෂණික ක්‍රමවේද මොනවා ද?

(ආ) මැනුම් සිදු කිරීමට භාවිත කරනු ලබන තාක්ෂණික ක්‍රමවේද දෙකක් විස්තර කරන්න.

(ඉ) සිතියම්ගත කිරීමට භාවිත කරනු ලබන තාක්ෂණික ක්‍රමවේද දෙකක් විස්තර කරන්න. (ලකුණු 08 යි)

(ii) (අ) කැඩැස්තර මැනුම් සඳහා පාලන පරික්‍රමණ පිහිටුවීමේ දී පවත්වා ගත යුතු නිරවද්‍යතා වර්ග මොනවා ද?

(ආ) කැඩැස්තර සිතියම් ප්‍රදේශයක පසුකාලීන මැනුමක් සිදුකිරීමේ දී පවත්වා ගතයුතු ස්ථානීය නිරවද්‍යතාව කොපමණ ද? (ලකුණු 04 යි)

(iii) (අ) මායිම් ලක්ෂණ (boundary features) සඳහා දත්ත රැස්කිරීමේ දී සපුරා ගත යුතු විශේෂ අවශ්‍යතා හා එහි සීමා මොනවා ද?

(ආ) ත්‍රිකෝණමානය (Total station) භාවිතයෙන් ක්ෂේත්‍රයක් තුළ මැනුමක් සිදු කරන ලදුව එහි අංකිත දත්ත සකස් කර ගන්නා ආකාරය සඳහන් කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

4. (i) (අ) වෘත්තීය අවකල්ක්‍රියා හේතුවෙන් ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු වරදකරුවකු විය හැකි අවස්ථා මොනවා ද?

(ආ) වෘත්තීය අවකල්ක්‍රියා සම්බන්ධයෙන් මැනුම් පනතේ සඳහන් වගන්තිය කුමක් ද? (ලකුණු 06 යි)

(ii) අලුතින් සිදු කරන ලද මැනුමක් එහි ම පැරණි මැනුමේ බිම් ප්‍රමාණය හා සැසඳිය යුතුව ඇත. එම සැසඳීමේ දී යොදාගනු ලබන ක්‍රමවේදය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) කිසියම් පිඹුරක අංකිත පිටපත අධීක්ෂණ නිලධාරියා විසින් තත්ත්ව පාලනයට ලක් කිරීමේ දී පරීක්ෂා කර බැලිය යුතු මූලික අංග මොනවා ද? (ලකුණු 08 යි)

5. (i) මධ්‍යම පාන්තික ජනපද පිහිටුවීමේ යෝජනා ක්‍රම තුළ මාර්ග සඳහා වෙන් කෙරෙන බිම් ප්‍රමාණ සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(ii) (අ) සත්ත්වයින් හා ශාක ආරක්ෂා කිරීමේ පනත යටතේ ජාතික රක්ෂිත ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නම් කර ඇති ස්ථාන මොනවා ද?

(ආ) වනජීවී සංරක්ෂිත භූමි ප්‍රදේශයක මායිමේ සිට සංවර්ධන කාර්ය සඳහා සීමා පනවා ඇති දුර ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 06 යි)

(iii) 1 : 10000 හු ලක්ෂණාත්මක සිතියම්වල දත්ත, ක්ෂේත්‍රයේ තහවුරු කිරීමේ දී මිනින්දෝරුවරයාගේ කාර්යභාරය කුමක් ද? (ලකුණු 08 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ (ශ්‍රී.ලං.මි.සේ.) II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (2018)

## (02) මැනුම් කළමනාකරණය

පැ තුනයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ඔබ විසින් සරල ඉඩම් පරිපාලන පද්ධතියක් පිහිටුවන්නේ යැයි උපකල්පනය කර එය ආරම්භයට පෙර සැලකිල්ලට ගත යුතු වඩාත් ම වැදගත් අංග සඳහන් කරන්න. *(ලකුණු 07 යි)*

(ii) ඉහත සඳහන් අංගවලින් තුනක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව තුළ දැනට පවතින ක්‍රමවේද මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) සිය මැනුම් කටයුතුවල කාර්යක්ෂමතාව වැඩිකර ගැනීම සඳහා නවක මිනින්දෝරු වෘත්තිකයන් විසින් නවීන තාක්ෂණය හා තොරතුරු තාක්ෂණය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

**2.** (i) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය මොනවා ද? *(ලකුණු 05 යි)*

(ii) ඉහත සඳහන් කාර්ය වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා විශේෂයෙන් පවත්වාගෙන යායුතු මූලික ලක්‍ෂණ මොනවා ද? *(ලකුණු 05 යි)*

(iii) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අනුයුක්ත මිනින්දෝරුවරයකු සතු මූලික වගකීම් සඳහන් කර, ඒවා ඉටු කිරීමට ඔබ විසින් ගන්නා ක්‍රියාමාර්ග මොනවා දැයි පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

(iv) සම්මත කරන ලද පිඹුරක මුද්‍රිත පිටපත හා ගබඩා කිරීම සඳහා භාරදුන් අංකිත පිටපත එකිනෙකට වෙනස් විය. මෙම තත්ත්වය වලකා ගැනීම සඳහා මිනින්දෝරුවරයෙකු සිය කාර්යභාරය කළමනාකරණය කරගන්නේ කෙසේ දැයි විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

**3.** මිනින්දෝරුවරයකු ලෙස ක්‍ෂේත්‍ර රාජකාරි සඳහා දෙපාර්තමේන්තු වාහනයෙන් ඔබ ගමන් කරමින් සිටිය දී එම වාහනය හදිසි අනතුරකට භාජනය වූයේ යැයි උපකල්පනය කරන්න.

(i) හදිසි අනතුරක් සිදු වූ අවස්ථාවක දී මිනින්දෝරුවරයකු සතු වගකීම් හා ඔබ විසින් එම අවස්ථාවේ දී ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

(ii) ඔබ වාහනය භාර නිලධාරියා නම් හා අනතුර සිදු වූ අවස්ථාවේ ඔබ වාහනයේ නොසිටියේ නම්, ඔබ සතු වගකීම් හා ඔබ විසින් ගන්නා ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

(iii) වාහන අනතුරක දී අවසාන පරීක්‍ෂණ මණ්ඩලය පත්කරනු ලබනුයේ කවුරුන් විසින් ද? *(ලකුණු 02 යි)*

**4.** (i) 1:50 000 සිතියම් පත්‍රයක් ක්‍ෂේත්‍ර පුනරීක්‍ෂණය සඳහා ඔබ වෙත භාර දී ඇති අවස්ථාවක එම කාර්යය සාමාන්‍ය ක්‍රමවේදයෙන් පරිබාහිරව ඉතා ඉක්මනින් ඉටුකර ගැනීම සඳහා ඔබට යොදා ගත හැකි ක්‍රමවේද මොනවා ද? *(ලකුණු 03 යි)*

(ii) "මිනින්දෝරුවරයා ඵලදායී ලෙස ඔහුගේ කාර්යය ඉටුකොට ඇත." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iii) කිසියම් ප්‍රදේශයක මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු සියලු ම භූගෝලීය දත්ත අංකිත මාධ්‍යයෙන් ඔබ වෙත සපයා ඇත්නම්,

(අ) එම ප්‍රදේශය තුළ පදිංචියට සුදුසු ඉඩම් හඳුනා ගැනීම සඳහා යොදාගත හැකි දර්ශක නම් කරන්න. *(ලකුණු 05 යි)*

(ආ) ක්‍ෂේත්‍රයට ගමන් කිරීමකින් තොරව පදිංචිය සඳහා වඩාත් සුදුසු හා ආර්ථිකමය වශයෙන් ඵලදායී ඉඩම් හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් යෝජනා කරන්න. *(ලකුණු 07 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

**5.** (i) "මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් වර්තමානයේ පවත්වාගෙන යනු ලබන විවිධ දත්ත පද්ධති මගින් එදිනෙදා කටයුතු කාර්යක්ෂමව සිදු කරගත හැකි වී ඇත."

(අ) ඉහත ප්‍රකාශය තහවුරු කිරීම සඳහා කරුණු පහක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(ආ) දැනට මිනින්දෝරු දෙපාර්තමේන්තුව තුළ භාවිතයේ පවතින දත්ත පද්ධති පහක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

(ii) (අ) වෘත්තීය මිනින්දෝරුවරයකු ලෙස ක්ෂේත්‍ර සටහන් මුද්‍රිත මාධ්‍යයෙන් පවත්වා ගැනීම නිසා අත්විය හැකි වාසි තුනක් කළමනාකරුවකුගේ දෘෂ්ටියෙන් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

(ආ) ක්ෂේත්‍ර සටහන් අංකිත මාධ්‍යයෙන් පමණක් පවත්වාගෙන යාමේ වාසි තුනක් නම් කරන්න. *(ලකුණු 05 යි)*

**6.** (i) වෘත්තීය මිනින්දෝරුවරයකු වශයෙන් පහත සඳහන් එක් එක් අවස්ථාවල දී ඔබ ගන්නා පියවර පැහැදිලි කරන්න.

(අ) හෙක්ටයාර 1/2 කට අඩු බිම් ප්‍රමාණයක් මැනීම සඳහා ඔබට ලබා දී ඇත්තේ එක් මැනුම් ක්ෂේත්‍ර සහායකයකු පමණි.

(ආ) මැනුම් කටයුත්තක් සඳහා සියලු කටයුතු සංවිධානය කර තිබූ අවස්ථාවක ඔබ වෙත අනුයුක්ත කර තිබූ වාහනයේ අත්‍යාවශ්‍ය හදිසි අලුත්වැඩියාවක් කළ යුතු බව ඔබ වෙත දන්වයි.

(ඉ) මාර්ග පුළුල් කිරීමක් සඳහා ඉඩම් අත්කර ගැනීමක දී ඉඩම් හිමිකරුවන් විසින් ඒ සම්බන්ධයෙන් විරෝධයක් දක්වන බව මැනුම් සිදුකරන දින ඔබ විසින් නිරීක්ෂණය කරන ලදී.

(ඊ) මිනින්දෝරුවරයාට ලබා දී ඇති මැනුම් උපකරණය ක්ෂේත්‍රයේ දී දැඩි ලෙස අලාභහානියට පත්විය.

*(ලකුණු 02 × 4 = 08 යි)*

(ii) තමා විසින් සිදුකරනු ලබන මැනුම් කටයුතුවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සෑම මිනින්දෝරුවරයකුගේ ම වගකීමකි. අංකිත දත්තවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සඳහා මිනින්දෝරුවරයකුට යොදා ගතහැකි ක්‍රමවේද මොනවා ද? *(ලකුණු 05 යි)*

(iii) මිනින්දෝරුවරයකු විසින් සකස් කරන ලද පිඹුරක සම්පූර්ණ බව (completeness) පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේදයක් යෝජනා කරන්න. *(ලකුණු 03 යි)*

(iv) අංකිත දත්තවල ආරක්ෂාව වෙනුවෙන් මිනින්දෝරුවරයකුට ගතහැකි පියවර මොනවා ද? *(ලකුණු 04 යි)*

***